ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## NCGG - SLIDA අවබෝධතා ගිවිසුම යටතේ දෙවන ධාරිතා සංවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් වේ

ඉන්දියාවේ යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය (NCGG) සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) අතර අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් සඳහා විශේෂයෙන් සකස් කරන ලද දෙවන ධාරිතා සංවර්ධන වැඩසටහන 2025 මැයි 26 දින සිට 2025 ජූනි 6 වන දින දක්වා පැවැත්විණ. ශ්‍රී ලංකාවේ නිලධාරීන් 40ක් මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ. පුහුණු වැඩසටහනේ අවධානය ඩිජිටල් පාලනය සහ නව්‍යකරණය හරහා රාජ්‍ය පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා මෙම යොමු විය.

2. මෙම පුහුණු වැඩසටහන ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් 2024 දෙසැම්බර් මාසයේ සිදු කරන ලද ඉන්දීය නිල සංචාරය අතරතුර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ කොටසකි. එම අවබෝධතා ගිවිසුම අනුව වසර 5ක් පුරා ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයන් 1500කට පුහුණුව ලබා දෙනු ඇත. මෙම තේමාව යටතේ ම 2025 අප්‍රේල් 21 වන දින සිට මැයි 2 වන දින දක්වා පැවති ප්‍රථම පුහුණු වැඩසටහන සඳහා ශ්‍රී ලංකා සිවිල් සේවකයන් 21 දෙනෙක් සහභාගී වූහ.

3. අන්තර්ජාලගත පොදු සේවා ඉහළ නැංවීම, ශක්තිමත් ඩිජිටල් යටිතල පහසුකම් පද්ධතියක් ගොඩනැගීම, නව්‍ය ඩිජිටල් විසඳුම් භාවිතයෙන් මහජන දුක්ගැනවිලි විසඳන ආකාරය වැඩි දියුණු කිරීම වැනි අංශ ආවරණය කරමින් ඩිජිටල් තාක්ෂණයන් හරහා පරිපාලනය පරිවර්තනය කළ හැකි ආකාර පිළිබඳව පුහුණු වැඩසටහනේ අවධානය යොමු විය. ජ්‍යෙෂ්ඨ ඉන්දීය නිලධාරීන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් 'ආධාර්', ඩිජිටල් ගෙවීම් සහ මූල්‍ය අන්තර්ග්‍රහණීයත්වය, Government e-Marketplace (GeM), රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධතිය වැනි ඉන්දියාවේ ප්‍රමුඛතම ඩිජිටල් පරිපාලන මූලපිරීම් පිළිබඳව වැදගත් තොරතුරු බෙදා ගන්නා ලදි. ශ්‍රී ලංකා නිලධාරීන් පිරිස මයිසූරියේ ලාල් බහාදූර් ශාස්ත්‍රී ජාතික පරිපාලන ඇකඩමිය, ඉන්දියාවේ මැතිවරණ කොමිසම, අග්‍රාමාත්‍යතුමාගේ ගති ශක්ති අනුභූති කේන්ද්‍රය, ජාතික ඊ - පාලන අංශය සහ උත්තරකාන්ඩ් හි පරිගණකගත ඉඩම් වාර්තා මධ්‍යස්ථානය වැනි ප්‍රධාන පෙළේ ආයතනයන් හි ක්ෂේත්‍ර චාරිකාවන් හිද නිරත වූහ. ටාජ් මහල වෙත සිදු කළ සංස්කෘතික සංචාරයකින් වැඩසටහන නිමාවට පත් විය.

4. ධාරිතා ගොඩනැගීම ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතාවයේ වැදගත් අංශයකි. මෙම අංශය තුළ ඉන්දියාවේ කැපවීම යළි තහවුරු

කරමින් අග්‍රාමාත්‍යතුමා 2025 අප්‍රේල් මස සිදු කළ නිල ශ්‍රී ලංකා සංචාරය අතරතුර ශ්‍රී ලංකාවේ වෘත්තිකයන් සඳහා විශේෂයෙන් සකසන ලද අමතර පුහුණු අවස්ථා 700ක් ලබා දෙන බව නිවේදනය කළේය. මේ අනුව ඉන්දියාවේ ධාරිතා පුහුණු වැඩසටහන්වලින් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1000කට ප්‍රතිලාභ හිමි වනු ඇත.

***

**කොළඹ**
***2025* ජූනි *09***